# කටපාඩම් පද - 5 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) සමිදාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්ණය; නොකිපෙන සුලුය. අතිශයින් කරුණාවන්තය. - **ගීතාවලිය** 103:8

2) නැගෙනහිරෙන් බටහිර ඈත්ව තිබෙන්නාක් මෙන් එතුමාණෝ අපේ පාප  අපෙන් දුරු කරන සේක. - **ගීතාවලිය** 103:12

3) හිමි තුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළංව සිටින සේක, තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක. - **ගීතාවලිය** 34:18

4) මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව; මාගේ පාප වලින් මා පිවිතුරු කළ මැනව. - **ගීතාවලිය** 51:2

5) දෙවිඳුන් ප්‍රිය පඬුර නම්, මිඳුණු හදවතකි. දෙවිඳුනි, ඔබ තැළුණු බිඳුණු සිතක් ඉවත නොදමන සේක - **ගීතාවලිය** 51:17

6) ආසිරි පැන් මට ඉසිනු මැනව. එවිට මම පිවිතුරු වන්නෙමි. මා ධෝවනය කළ මැනව; එවිට  මම හිමට වඩා සුදු වන්නෙමි. - **ගීතාවලිය** 51:7

7) දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාල මැනව. තිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව. - **ගීතාවලිය** 51:10

8) සත්‍යයට හා අවංක බවට ඔබ ප්‍රිය කරන  සේක. එබැවින් සැබෑ ප්‍රඥාව මට ඉගැන්නුව මැනව. - **ගීතාවලිය** 51:6

## අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

9) පාප ක්ෂමාව කෙරෙහි මම විශ්වාස කරමි - 10 **වගන්තිය**

10) අනන්ත ජීවිතය කෙරෙහි මම විශ්වාස කරමි - 12 **වගන්තිය**